# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
## සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය

# දෙමළ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව(ව්‍යාප්ත)
# 2023/2024 - (09) කණ්ඩායම

**පාඨමාලාව ආරම්භ කිරීම - 2023 දෙසැම්බර්**

**කාල සීමාව : වසරකි.( ඉරිදා දින පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

දෙවන බසක් හැදෑරීමේ දී සිසුනට පැන නැගෙන ගැටලු විසඳන විද්‍යානුකූල හා මනෝවිද්‍යාත්මක ක්‍රම උපයෝගී කරගෙන දෙමළ බස උගන්වන අපගේ ප්‍රවීණ ආචාර්යවරුන් යටතේ දෙමළ බස ඉගෙනීමට දැන් ඔබට අවස්ථාව සැලසී ඇත.

## ඉලක්කගත පිරිස

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පාසල් හැර ගිය සිසුන්, රැකියා නියුක්තිකයින්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු ආරක්ෂක සේවාවන්හි නිරත වූවන්, සංචාරක ව්‍යාපාරයෙහි යෙදෙන්නන් සහ වෙළඳ ව්‍යාපාරකයින්, මාධ්‍යවේදීන් ආදී පිරිස් සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

### පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම්

1. අ.පො.ස. (සා.පෙළ) විෂයන් 6කින් සහ සම්මාන තුනකින් සමත්වීම **හෝ**
2. අ.පො.ස. (සා.පෙළ) විෂයන් 6 කින් සමත්ව රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ වසර 02ක සේවා පළපුරුද්ද **හෝ**
3. අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයටද අයදුම්කල හැකිය. (විභාග ප්‍රතිඵල පසුව ඉදිරිපත් කල යුතුයි) **හෝ**
4. අධ්‍යයන මණ්ඩලය විසින් සලකා බලා විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම

### පාඨමාලා ගාස්තු

අයදුම්පත් ගාස්තුව - රු: 250.00
ලියාපදිංචි ගාස්තුව - රු: 500.00
පාඨමාලා ගාස්තුව හා විභාග ගාස්තු - රු: 28,000.00
වාරික දෙකකින් ගෙවිය හැක.(20,000.00+8,000.00)

**අයදුම්පත් නිකුත් කිරීම හා භාර ගැනීම**
**2023 ජූලි 23 වැනි දින සිට 2023 දෙසැම්බර් 15 දක්වා**

මිහින්තලේ ලංකා බැංකු ශාඛාවේ ''**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**'' නමින් ඇති ගිණුම් අංක **5022233** ට රු: 250.00 මුදලක් ගෙවා ලබා ගත් රිසිට් පත (මනිඕඩර් හෝ චෙක්පත් භාරගනු නොලැබේ) සමඟ නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රය **නියෝජ්‍ය ලේඛකාධිකාරි, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ** ලිපිනය වෙත 2023 දෙසැම්බර් මස 15 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයෙන් (CDCE) හෝ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් ද අවපතනය (Download) කළ හැකි ය.

**වැඩි විස්තර** - *025 2260120 - (CDCE),*
*වෙබ් අඩවිය* - www.rjt.ac.lk හෝ http://cdce.rjt.ac.lk/cdce/news.php

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ
2023.07.23